දිවි තොර කර ගැනීම් වගකීම් සහගතව වාර්තා කළ යුතු යැයි පවසන විට, දිවි තොර කර ගැනීම් සම්බන්ධ වන පුවත් ද ඊට අදාළවන බව පාඨකයින් ලෙස අප අවබෝධ කරගත යුතු වේ.

මෙයට නිදසුනක් ලෙස, මට්ටක්කුලිය, කදිරානවත්ත ප්‍රදේශයේ, ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව සිදුවීමක් හේතුවෙන් සිදු වූ හදිසි අනතුරක් සහ, ඉන් පසුව සිදු වූ දිවි තොර කර ගැනීමේ සිදුවීමක් මාධ්‍ය තුළ වාර්තා වී ඇති ආකාරය සලකා බැලිය හැක.

* මෙහි දිවි තොර කර ගත් ආකාරය සිරස්තලයේත්, අන්තර්ගතය තුළත් සඳහන් කර ඇත.

* හදිසි උපකාරක අංක සඳහන් කර නොමැත.

මෙවැනි පුවතක් සමඟින් විශේෂයෙන්ම හදිසි උපකාරක අංක සඳහන් කිරීම අත්‍යවශ්‍ය වේ. මන්ද යත්, ඒ ඔස්සේ අනුකාරක සිදුවීම් වළක්වා ගැනීමට හැකියාව ලැබෙන බැවිනි.

දිවි තොර කර ගැනීම් සම්බන්ධ වන පුවත් වගකීම් සහගතව වාර්තා කරමු!

උපකාරක අංක පළ කරමු, ජීවිතයක් රැක ගනිමු!

හදිසි උපකාරක අංක:

*CCCline - 1333
*ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0707308308
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)

(මෙම පුවත එදින, මෙම පුවත්පතෙහි සහෝදර ඉංග්‍රීසි පුවත්පත තුළ පළ වී නොතිබුණි.)